


**හැඳින්වීම**

ලෝරන්ස් ඩබ්ලිව්. රීඩ්

**පසුවදන**

මිල්ටන් ෆ්‍රීඩ්මන්

**සිංහල පරිවර්තනය**

අරුණි ශපීරෝ

# මම, පැන්සල

## මගේ පවුලේ ඉතිහාසය ලෙනාර්ඩ් ඊ. රීඩ්ට දැන්වූයේ මෙපරිද්දෙනි

ප්‍රථම ඩිජිටල් මුද්‍රණය: 2013

ප්‍රථම කඩදාසි මුද්‍රණය: 2016

ISBN 978-955-42782-0-2

www.arunishapiro.wordpress.com

ආර්ථික අධ්‍යාපන පදනමට ස්තුතියි

මම, පැන්සල නම් වූ මෙම කෘතියේ ඉංග්‍රීසි මූලාශ්‍ර හිමිකම් සතු ආර්ථික අධ්‍යාපන පදනමේ අවසරය ලබාගෙන මෙය සිංහල භාෂාවට පරිවර්තනය කරන ලදි. මෙම කටයුත්ත සඳහා එම පදනම වෙතින් කිසිම අනුග්‍රහයක් නොලැබුන බවත්, එම පදනමේ නිලතල හෝ එහි වෙන සම්බන්ධතාවයක් නොමැති බවත්, මෙහි දී පරිවර්තනය හැරෙන්නට මෙහි පරිවර්තකයාගේ අදහස් කිසිවක් පළ නොවන බවත් කරුණාවෙන් සලකන්න.

FEE FOUNDATION for ECONOMIC EDUCATION

1718 Peachtree Street NW, Suite 1048, Atlanta, GA 30309

www.FEE.org

# ලෙනාර්ඩ් ඊ. රීඩ් (1898-1983)

ලෙනාර්ඩ් ඊ. රීඩ් විසින් 1946 දී ආර්ථික අධ්‍යාපන පදනම පිහිටුවන ලදි. එතැන් පටන් පුරා වසර 37 ක් ඔහු එහි සභාපති ධූරය හොබවමින්, නිදහස කුමක්දැයි කියා දෙන්නටත්, එය වෙනුවෙන් පෙනී සිටින්නටත් නොනැවතී වෙහෙසුනෙකි. ඔහු ස්වභාවයෙන්ම නායක ගතිපැවතුම් දැක්වූයේය. ඇමෙරිකන් ඉතිහාසයේ ඉතා වැදගත් අවස්ථාවක දී හෙතෙම ඒකීය පුද්ගල නිදහස සහ පෞද්ගලික දේපල ආරක්ෂා කිරීම වෙනුවෙන් ජනතාව සංවිධානය කරන්නට සමත් විය.

අදහස්වල ඇති බලය කියාපාන්නට ඔහුගේ ජීවිතය කදිම නිදසුනකි. හිටපු ජනාධිපති රොනල්ඩ් රේගන් මෙසේ ලියා ඇත: “නිදහස නාමයෙන් කරන ලද ඔහුගේ කැපවීම නිසා අපේ රටත් ඇයගේ ජනතාවත් සමෘද්ධිමත් වූහ. ඉදිරි අනාගත පරම්පරාවන්ද දිරිය ලබාගන්නට ලෙනාර්ඩ් ඊ. රීඩ් සොයනු ඇත.”

ලෙනාර්ඩ් පොත් 29 ක් සහ සිය ගණනක ලිපි ලේඛන ලියා ඇත. ඔහුගේ වඩාත්ම සුප්‍රසිද්ධ කෘතිය වන **මම, පැන්සල** මුලින්ම ප්‍රකාශනය වූයේ 1958 දී ය. කර්මාන්තයේ අංගෝපාංග කිහිපයක් හා ස්ථානවල නම් කිහිපයක් වෙනස් වුවද මෙහි එන මූලික සිද්ධාන්ත සත්‍යයන් සේ තවමත් පවතී.



# හැඳින්වීම

එළිදැක්වීමෙන් ශතක බාගයක් ගෙවුනාට පසුවත්, ලෙනාර්ඩ් ඊ. රීඩ් ලියූ “මම, පැන්සල” කෘතිය කියවද්දී ව්‍යක්ත, සුවිශේෂී, සදාකාලික, සුසුමාදර්ශයන් වෙනස් කරන්නට හේතු පාදක වේ. සම්භාව්‍ය යනාදී වූ පැසසුම් රැගත් විශේෂණ අප හදවත් තුළ තවමත් ජනිත කරවයි. මේ පුංචි රචනාව ලොකු කුඩා කාගේත් මනස පුබුදුවන්නට හා ඇස් හරින්නට උපකාර වෙයි. බොහෝ පාඨකයන් මෙය කියැවූවාට පසුව ලොව දකින්නේ වෙනස් විදියකටයි.

සිත්ගන්නා කතන්දරයක් වටා එතුනු කළ අදහසක් දැඩිසේ බලපෑමක් ඇති කරයි. ලෙනාර්ඩ් විසින් දක්වන මූලික කරුණ නම් පැන්සලක් හදාගන්නට අවශ්‍ය සියලු තොරතුරු හා කුසලතා එක් අයෙකු තුළ නැති නිසා ආර්ථික "සැලසුම්" කරන්නට ද ඉතා අසීරු බවයි. ඒ පණිවිඩය දිග හැරෙන්නේ පැන්සලක් කියන තමන්ගේ කතන්දරයෙනි. ලෙනාර්ඩ්ට “මම, වාහනයක්” හෝ “මම, ගුවන්යානයක්” යැයි කියමින් මේ පණිවිඩය දිය හැකිය. එහෙත් එවැනි සංකීර්ණ භාණ්ඩයක් තෝරා ගැනීමෙන් පණිවිඩයේ ඔද අඩුවෙයි. කොපමණ බුද්ධියක් තිබුණත්, කොච්චර උපාධි සහතික ලබා තිබුණත්, සරල සහ හැමදාම පාවිච්චියට ගන්නා වූ පැන්සලක් මුල සිටම තනියම හදන්නට කිසිම කෙනෙකුට නොහැකිය. ඉතින්, වාහනයක් හෝ ගුවන්යානයක් ගැන කියන්නට අවශ්‍ය නොවේ.

මේ පණිවිඩය ඕනෑම උසස් හෝ බලවත් අයෙක්ව නිරහංකාර කරවන්නට සමත් වූවකි. අනික් අයගේ වැඩවලට ඇඟිලි ගහන්නට තමන් දන්නවා යැයි සිතමින් පිම්බී සිටින අහංකාර මනස් මෙය කියැවීමෙන් පසු සිදුරු වී හැකිළෙනු ඇත. මෙහි සරල භාෂාවකින් විස්තර කරදෙන්නේ, මධ්‍යම සැලසුම් යනු අධිමානයෙන් කරන නිරර්ථක වෑයම් කියායි. නැතහොත් එයින් පෙන්වනුයේ, නොබෙල් ත්‍යාගලාභී සහ ඔස්ට්‍රියන් අර්ථශාස්ත්‍රඥයෙකු වූ එෆ්. ඒ. හයෙක් නිසි ලෙසින් දැක්වූ “මවා පාන දැනුම” යන්න කුමක්දැයි කියාය.

මේ ගැන හිතන්නට රීඩ්ට වඩාත්ම සහාය වූයේ 1945 දී හයෙක් ලියූ “සමාජයේ දැනුම පාවිච්චි කරන හැටි” නම් ලිපියයි. එවක වූ සමාජවාදීන්ගේ බොරු මතවාද බිඳ දමමින්, “මෙය සැලසුම් කරනවා ද නැද්ද යන ගැන වාදයක් නෙමෙයි. සැලසුම් කිරීම මධ්‍යම ලෙසින් කරනවා ද යන්න ගැන සහ සම්පූර්ණ ආර්ථික පද්ධතියට එක බලධාරියෙක් පත්කරනවා ද යන්න ගැන හෝ එය බහුතර පුද්ගලයන් අතර බෙදාහරිනවා ද යන්න ගැන වූවකි,” යැයි හයෙක් එම ලිපියෙන් සාකච්ඡා කළේය.

“බිත්තර නොකඩා ඔම්ලට් හදනු නොහැකියි,” යන හද සළිත කරවන ප්‍රකාශයෙන් කුරිරු ප්‍රංශ විප්ලවයට ආශීර්වාදයක් දුන්නේ මැක්සිමිලියන් රොබෙස්පියර් විසිනි. දැඩි ආණ්ඩුවාදියෙක් වූ හෙතෙම අනුන්ගේ ජීවිත සැලසුම් කිරීම සඳහා මහත් සේ වෙහෙසුනෙකි. ප්‍රංශ විප්ලවයේ දරුණුතම භීෂණ සමය නොහොත් 1793-94 කාලය ඔහු විසින් නිර්මාණය කරන ලද්දකි. දහස් ගණනින් බිත්තර කැඩුවේ රොබෙස්පියර් සහ ඔහුගේ ගිලටිනයයි. ආණ්ඩුවේ බලයෙන් සමාජය සැලසුම් කළ අය ඉහළින් ද, සෙසු පුරවැසියන් සියල්ලන්ම පහළින් ද සිටින සේ ඔහු නීති විපර්යාස කරමින් ඔහු හොඳ යැයි සිතූ උතෝපියාවකට ගත් අසාර්ථක උත්සාහය එදා සිද්ධ විය.

ඉහත ප්‍රංශ ප්‍රකාශය සිත සසල කරවන හුරු පුරුදු රැල්ලක තවත් එක උදාහරණයක් පමණි. එවැනි අයව ඔබ කැමති නමකින් හඳුන්වන්න හැකියි. සමාජවාදීන්, මැදිහත්වීමට රුචි වූවන්, සාමූහිකවාදීන්, ආණ්ඩුවාදීන් යනාදී ඕනෑම නමක් ඔවුනට දැමිය හැකියි. ඔවුන්ගේ දැක්ම පරිදි වූ පොදු යහපතක් වෙනුවෙන් සමාජය වෙනස් ආකාරයෙන් සැකසුම් කිරීමට ඔවුන් ගන්නා ලද උත්සාහ වලින් ඉතිහාසය පිරී ඉතිරී ඇත. ඒ වෑයම් ගනිද්දී ඔවුන් පිරිසක් මරා දැමූහ. තව පිරිසක් හිඟමනට ඇද දැමූහ. සමාජවාදයට සොහොන් කොතක් කවදා හෝ ඉදිවෙන්නේ නම්, එහි සටහන්

විය යුත්තේ මෙයයි: මෙතැන වැළලී ඇත්තේ සියල්ල දන්නවා යැයි කියාගත්තවුන් විසින් කොතරම් බිත්තර කැඩුවත් ඔම්ලට් එකක් නොලැබෙන්නට නිර්මාණය කරන ලද ප්‍රයෝගයයි.

ලෝකයේ සිටි කිසිම රොබෙස්පියර් කෙනෙක් පැන්සලක් හදන්නට නොදත්තේය. එහෙත් ඔවුනට සම්පූර්ණ සමාජයක් ගොඩනඟන්නට උවමනා වූහ. මොන විකාරයක් ද, කොතරම් දුක්මුසු ශෝකාන්තයක්ද!

එහෙත් ලෙනාර්ඩ් රීඩ්ගේ පණිවිඩයේ දැඩි වැදගත්කම, අපි දන්නා ආඥාදයකයන් වෙත පමණක් එල්ල වෙනවා යැයි අපි උපකල්පනය කළ හොත් අපි අපගේ කාර්ය භාරය පැහැර හැරිය අය වන්නෙමු. "මම, පැන්සල" කියා දෙන පාඩමේ සඳහන් වනුයේ වැරැද්ද පටන් ගැනෙනුයේ සැලසුම්කරුවන් ලොකු සැලසුම් හදන විට කියා නොවේ. වැරැද්ද හටගන්නේ අයෙක් නිහතමානීකම පැත්තකට දමා, නොදන්නා දෙයක් දන්නා ලෙසින් හැසිරෙමින්, සාමකාමී ඒකීය පුද්ගලයන්ට එරෙහිව රජයේ බලය පාවිච්චි කරන්නට පටන් ගනිද්දීය. මෙය කිසිසේත්ම ජාතික රෝගයක් පමණක් නොවේ. එය ඉතා ළඟින්ම සිද්ධ වෙන්නා වූ ප්‍රාදේශීය මට්ටමෙන් හටගන්නා රෝගයක් ද වෙයි.

අප අතර ඉන්න සමහරු හිතන්නේ ඔවුනට රජයේ බලය ලැබෙන්නේ නම් හෙට වෙළඳපොලේ දී දිනන්නේ කවුදැයි සහ පරදින්නේ කවුදැයි කියා තෝරන්නට හැකියාව ඇතැයි කියායි. ඔවුනට මිල තීරණය කරනු හැකි යැයි කියායි. ඔවුනට කුලිය තීරණය කරනු හැකි යැයි කියායි. අපේ ගෙවල් හා වාහන දුවන්න ඕනෑ කුමන ඉන්ධන වලින්දැයි තීරණය කරනු හැකි යැයි කියායි. කුමන කර්මාන්ත පැවතිය යුතුද, කුමන කර්මාන්ත මුලිනුපුටා දැමිය යුතුදැයි තීරණය කළ හැකි යැයි කියායි. ඉතින් ඔව්හු මඳකට නැවතී මේ කුඩා ලියන උපකරණයෙන් යම් නිහතමානීත්වයක් ඉගෙන ගත යුතුයි.

"මම, පැන්සල" විසින් මධ්‍යම සැලසුම්වල පදනමක් නැති අපේක්ෂාවන් ප්‍රතික්ෂේප කරනවා පමණක් නොව, එය ඒකීය පුද්ගලයා ගැන උත්තරීතර වූ ධෛර්යයක් සිතට නංවාලන දැක්මක් ඉදිරිපත් කරයි. ඇඩම් ස්මිත්ගේ "අදිසි හස්තය" නැමති සංකල්පයෙන් මිල, දේපල, ලාභ, ප්‍රතිලාභ යනාදියට මාර්ගෝපදේශකයක් ලැබී, නිදහස් මිනිසුන් විසින් සමාජවාදී න්‍යායවාදීන්ට සිහින මවන්නට පමණක් හැකි ආර්ථික හාස්කම් ඉටු කරති. කිසිම "මාස්ටර් මොළයක්" නොමැතිව ලෝකය වටා නන් දෙසින්, අනේක ලෙසින්, විවිධ වූ උවමනාවන් ඇතිව එකතු වෙන ජනතාවක් පැන්සල් නිෂ්පාදනය කරද්දී ඔවුන් නිදහස් වෙළඳපොලක දී එකතු වෙන්නේ තවත් වඩාත් ඉහළ මට්ටම් වලින් මිලියන සිය ගණනින් වූ ජනතාවකට කන්න, අඳින්න, නිවාස, අධ්‍යාපනය හා විනෝදය සපයන්නටයි.

ආර්ථික අධ්‍යාපන පදනම ඉතා ආඩම්බරයෙන් මෙම "මම, පැන්සල" හි නව මුද්‍රණය එහි පනස්වැනි සංවත්සරය සැමරීමට නිකුත් කරයි. අනාගතයේ දිනයක එහි ශත සංවත්සර මුද්‍රණයක් පළ කෙරෙනු ඇත. සමහර විට එහි සහශ්‍ර වාර්ෂික මුද්‍රණයක් ද කෙරෙනු ඇත. මේ රචනාව සත්‍යයෙන්ම යම් කාලයකට සීමා වූවක් නොවේ.

**ලෝරන්ස් ඩබ්ලිව්. රීඩ්**

සභාපති

ආර්ථික අධ්‍යාපන පදනම

# මම, පැන්සල

මම පැන්සලකි. කියවන්නට හා ලියන්නට දැනුම ඇති වැඩිහිටියන්ටත්, දරු දැරියන්ටත් එකසේ හුරු පුරුදු මිනිරන් කූරක් වටා ලීයෙන් නිමැවුණ සාමාන්‍ය පැන්සලකි.

ලිවීම මගේ වෘත්තීය මෙන්ම මගේ විනෝදාංශය ද වෙයි; මා කරන්නේ එය පමණි.

මගේ වංශ පරම්පරාව ගැන ලිවිය යුත්තේ මන්දැයි ඔබ කල්පනා කරනු ඇත. මගේ කතාන්දරය අතිශය රසවත්ය. එය මුල්ම කාරණයයි. ඊළඟට මම අබිරහසකි. ගහකටත් වඩා, හිරු බැස යන සැන්දෑවකටත් වඩා, අකුණු සැරයකටත් වඩා දැඩි අබිරහසක් වෙමි. එහෙත් මාව පාවිච්චියට ගන්නා අයගෙන් බහුතරය හිතන්නේ මම කිසිත් පසුබිමක් නැති අහඹු සිද්ධියක් පමණක් කියායි. ඒ නොසැලකිල්ලක් දක්වන ගතිය නිසා මාව කිසිත් වැදගැම්මකට නැති තත්වයකට ඇද දමා තිබේ. මේ දරුණු වරද හේතුවෙන් මිනිසාට විනාශ මුඛයට මුහුණ නොපා වැඩි කාලයක් පැවැත්ම ආරක්ෂා කරගත නොහැකිය. එය ප්‍රඥාවන්තයෙක් වූ ජී. කේ. චෙස්ටර්ටන් දුටු අන්දමින් කිව්වොත්, "අපි වැනසෙන්නේ ආශ්චර්යයන් නැතිකම නිසා නොවේ, ආශ්චර්යයන් දකින්නේ නැතිකම නිසාය".

මම, පැන්සල පිටතට පෙනෙන පරිද්දෙන් ඉතා සරල වූ උපකරණයකි. මම ඔබේ පුදුමයට හා ගරු සරුවට පාත්‍ර විය යුත්තෙක්මි. මම මෙය ඔබට ඔප්පු කර පෙන්වන්නට මේ රචනාවෙන් වෑයම් කරන්නෙමි. ඔබට මාව වටහාගන්නට පුළුවන් නම් -නැහැ එය කිසිවෙකුගෙන් ඉල්ලන්නට බැහැ- ඔබට පුළුවන් නම් මම සංකේතවත් කරන හාස්කම ගැන යම් දැනීමක් ඇති කරගන්නට, එවිට ඔබට හැකිවේවි මිනිසා ඉතා දොම්නසින් අහිමි කරගනිමින් සිටින නිදහස බේරාගන්න. ඔබට කියා දෙන්න මට ඇත්තේ ඉතා ගැඹුරු පාඩමකි. වාහනයකට හෝ ගුවන්යානයකට හෝ පිඟන් හෝදන යන්ත්‍රයකට වඩා පහසුවෙන් මට මේ පාඩම ඔබට කියා දිය හැකියාව ඇත්තේ පෙනුමෙන් මා ඉතා සරල වූ උපකරණයක් නිසාමය.

සරල, ඔව් එහෙත්, ලොව කිසිම පුද්ගලයෙකුට තනිවම මාව නිෂ්පාදනය කරන්නට හැකි දැනුමක් නැත. මේක අරුම පුදුම කතාවක් යැයි සිතනවා නේද? විශේෂයෙන්ම ඇමෙරිකාවේ මගේ ජාතියේ අය බිලියන භාගයක් විතර වසරකට නිපදවෙනවා යැයි ඇහෙද්දී.

මාව අතට අරගෙන එහාට මෙහාට හරවලා බලන්න. මොකක්ද ඔබ දකින්නේ? ඇහැට පෙනෙන වැඩි යමක් නැහැ. ලී පොඩ්ඩක්, ඔප දමන්න යොදාගත් වානිෂ් ටිකක්, පින්තාරු කළ ලේබල් ටිකක්, මිනිරන් කූරක්, යකඩ ඩිංගක් සහ මකනයක් යනාදියෙන් යුතු වූ සරල උපකරණයක් පමණයි.

## ගණනය කළ නොහැකි තරම් වූ පෙර විත්ති

ඔබේ වංශ පරම්පරාවේ වැඩි ඈතක් කරා යන්නට ඔබට නොහැකි සේම, මමත් මගේ පෙර විත්ති සියල්ලම නමින් කියන්නට හා පැහැදිලි කරන්නට අපොහොසත් වෙමි. එහෙත් මගේ පසුබිමේ සංකීර්ණත්වය සහ සාරවත්බව ඔබේ සිතේ සටහන් වන පරිද්දෙන් පෙන්විය හැකි තරමින් මම මෙසේ තොරතුරු ගෙනහැර දක්වමි.

මගේ පෙළපත පටන් ගැනෙන්නේ ගහකින්. උතුරු කැලිෆෝනියාවේ සහ ඔරිගොන් හි කෙළින් ඉහළට වැඩෙන සීඩ නැමති ගහකින්. දැන් කල්පනා කරන්න මේ සීඩ ගස් කපන්න, සීඩ ලී කොටන් රේල්ලුවට ගෙනියන්න පාවිච්චි කරන ලද කියත්, ලොරි, කඹ යනාදිය කොච්චරක් වූවා ද කියා. ඒවා හදන්නට ගණනය කළ නොහැකි වූ කුසලතා වලින් පිරි කොතරම් පිරිසක් සහභාගී වූවාද කියා හිතන්න: පතල් කනින්න, යකඩ හදන්න, යකඩ වලින් කියත් හදන්න, යන්ත්‍ර වලට අවශ්‍ය මෝටර් හදන්න, ශක්තිමත් කඹයක නිමාවට පෙර එහි නොයෙක් අවස්ථාවල දී කළ යුතු දේවල් ඉටුකරන්න, ලී කොටන් සඳහා ගස් කපන කඳවුරුවල අයට නිදන ඇඳන් හදන්න, ඔවුනට

කෑම සපයන කුස්සි හදන්න, ඒවායේ පිළියෙල වූ ආහාර වගා කරපු අය, යනාදියෙන් කොපමණ පිරිසක් හවුල් වුනාදැයි සිතන්න. ගස් කපන අය බිව්ව කෝපි කෝප්පයක් හදන්නත් කොතරම් දහස් ගණනක් සහභාගී වූවාදැයි සිතන්න!

කැලිෆෝර්නියාවේ සැන් ලියැන්ඩ්‍රෝ හි ලී මෝලකට තමයි මේ දර කොටන් යැවුනේ. ඉතින් ප්‍රවාහනයට ගත්ත දුම්රිය පෙට්ටි, දුම්රිය මාර්ගය, දුම්රිය එන්ජින් හදන්න කොච්චර පිරිසක් එකතු වුනාදැයි හිතන්න. ඔවුන් අතර සන්නිවේදනය පහසු කරගැනීම සඳහා කී දෙනෙක් සහාය වුණාද? ඒ සියලු පිරිස් මගේ පෙළපතට අයිති වූවන්.

දැන් හිතන්න සැන් ලියැන්ඩ්‍රෝ හි ඇති ලී මෝල ගැන. සීඩ කොටන්, අඟල් හතරෙන් එකකට අඩුවෙන් ඝනකමෙන් යුතු කුඩා පතුරුවලට කපන්න අවශ්‍යයයි. මේවා උදුනකට දමා වියැළෙනවා. ඊට පස්සෙ ගෑණු අය මුහුණේ වත්සුනු ගාන හේතුව නිසාම මේවාටත් සායම් පොවන්න අවශ්‍යයයි. මිනිස්සු කැමති මම සුදුමැලි විදියට ඉන්නවා දකින්න නෙමෙයි, ලස්සන වෙලා ඉන්නවා දකින්නටයි. ඊට පස්සෙ මේ ලී පතුරුවල ඉටි ගාලා ආයෙත් උදුනක වියළා ගැනෙනවා.

සායම් හදන්න, උදුන් හදන්න, රස්නෙ ලබාදෙන්න, විදුලි එළිය හා බලය ලබාදෙන්න, යන්ත්‍රවලට අවශ්‍ය මෝටර් සහ බෙල්ට් හදන්න, සහ ලී මෝලකට අවශ්‍ය අනික් අංගෝපාංගයන් හදන්න කොච්චර කුසලතා ගණනාවක් පාවිච්චියට ගැනෙනවාද? ලී මෝල අතුගාන අයත් මගේ පෙළපතට අයත් වෙනවාද? ඔව්, ඒ වගේම ලී මෝලට විදුලි බලය සපයන පැසිෆික් ගෑස් ඇන්ඩ් ඉලෙක්ට්‍රික් කොම්පැණියේ වේල්ල බඳින්න කොන්ක්‍රීට් වත්කරපු පිරිමින් ද මගේ පෙළපතට අයිතියි!

කැලිෆෝර්නියාවේ සිට විල්ක්ස්-බැරෙ වෙත දුම්රිය පෙට්ටි හැටක් පිරෙන්න ලී පතුරු ගෙනියන්න, අඩුක් කරගන්න, බාන්න හා ප්‍රවාහනයට සහාය වෙන්න ළඟින් හා ඈතින් සිටි මුතුන් මිත්තන් ද අමතක කරන්න එපා!

**සංකීර්ණ යන්ත්‍ර**

පැන්සල් කම්හලේ අයිතිය, ඉතිරි කිරීමෙන් හා අරපිරිමැස්මෙන් මූලධනයක් එකතු කරගත්තු මගේ දෙමාපියන්ගෙ. එහි යන්ත්‍ර සූත්‍ර හා ගොඩනැඟිලිවල වටිනාකම ඩොලර් මිලියන හතරක්. සංකීර්ණ මැෂිමකින් මෙතැනට ගෙනෙන හැම ලී පතුරකටම පීලි අටක් දෙනවා. ඊට පස්සෙ තවත් සංකීර්ණ මැෂිමක් ලී පතුරක් හැර ලී පතුරක මිනිරන් කූරක් තබනවා. මැලියම් ගානවා. ඊට උඩින් තව ලී පතුරක් තබනවා. හරියට මිනිරන් සැන්ඩ්විච් එකක් වගෙයි කියන්න පුළුවන්. මේ ලී පතුරු එකට එක සවිකරන සැන්ඩ්විච් මැෂිමෙන් තමයි මමත් මගේ සහෝදරයන් හත් දෙනෙකුවත් එකවරම යාන්ත්‍රිකව කැටයම් කෙරෙන්නෙ.

මිනිරන් පැන්සල් කිව්වට මිනිරන් (ඊයම්) ඇත්තෙ නැහැ. ඒක තවත් සංකීර්ණ කතාවක්. පතල් වලින් ග්‍රැෆයිට් කැනීම සිද්ධ වෙන්නෙ ලංකාවේ. මේ පතල් කනින මිනිස්සු ගැන හිතන්න. එයාලට අවශ්‍ය උපකරණ හදන අය ගැන හිතන්න. පතල් වලින් හාරන ග්‍රැෆයිට් දාන්න මලු හදන අය ගැන හිතන්න. ඒ මලු ගැටගහන්න ලණු හදන අය. ඒවා ප්‍රවාහනයට සහාය වෙන අය, ඒවා නැව් පටවන අය, ඒ නැව් හදන අය. ඉතින් මගේ උපතට අතරමගදී සහාය වෙච්ච ප්‍රදීපාගාරවල අය, වරයාන්වල නියමුවන් යනාදීන් එහෙමත් ඉන්නවා.

ඒ ලංකාවෙන් ගෙනාපු ග්‍රැෆයිට් මිශ්‍ර වුණේ මිසිසිපි වලින් ගෙනාපු මැටි සමඟ. ඒ ක්‍රියාවට ඇමෝනියම් හයිඩ්‍රොක්සයිඩ් යොදා ගැනුණා. ඒවා තෙත් කරන්න ආධාරක වෙන සල්ෆ යෙදූ ටැලෝ නොහොත් සල්ෆියුරික් අම්ල සමඟ රසායනිකව ප්‍රතික්‍රියා කරන ලද සත්ව මේද පාවිච්චියට ගැනුණා. මැෂින් ගණනාවකින් රිංගලා ගිහින් මේ මිශ්‍රණය -හරියට සොසේජ් අරඹරන යන්ත්‍රයකින් වගේ- එළියට එන්නෙ අගක් නැති ආකාරයකට. එය අවශ්‍ය පමණට කපා, වියළා ගෙන, ෆැරන්හයිට් අංශක 1850 ක රස්නයකින් පැය ගණනාවක් යන තෙක් උදුනක දාලා ගන්නෙ. එහි ශක්තිය හා සුමට බව වැඩිකරන්න මෙක්සිකෝ රටෙන් ගෙනෙන කැන්ඩෙලිලා ඉටි සමඟ පැරෆින් ඉටි සහ හයිඩ්‍රජනීකෘත ස්වභාවික මේද උණු මිශ්‍රණයක් වත් කෙරෙනවා.

මගේ සීඩ ලී කෑලි වලින් හැදූ පැන්සලට වානිෂ් තට්ටු හයක් ලැබෙනවා. ඔබ දන්නවාද වානිෂ්වල අඩංගු දේවල් සියල්ල මොනවාදැයි කියා? එඬරු ඇට වවන අය, එඬරු තෙල් පෙරන අය යනාදීන් ද මේ වානිෂ් හදන්න සහාය වෙන අයත් මගේ මුතුන් මිත්තන් නොවේද? ඔව්, ඒ අයත් මගේ පෙළපතේ අය. වානිෂ් ලස්සන සහ කහ පාටින් ඉදිරිපත් කරන්නට වෙහෙසෙන අය ගැන කිව්වොත්, ඒ අයත් ගණනය කරන්න බැරිතරම් වූ කුසලතා සතු පිරිසක්.

බලන්න මේ ලේබල් එක දිහා. කාබන් අළු එක්ක ලාටු වර්ගයක් මිශ්‍ර කරලා හදපු දෙයක් උණුසුම් කරල අලවන තුනී තට්ටුවක් තමයි ලේබල් එක කියන්නෙ. කොහොමද ලාටු හදන්නෙ? කියන්න මොනවාද කාබන් අළු කියල?

පුංචි පැතලි යකඩ කෑල්ල පිත්තල වලින් හැදිලා තියෙන්නෙ. තුත්තනාගම් සහ තඹ ගන්න පතල් කනින අය ගැන හිතන්න. මේ ස්වභාවයෙන් ලැබෙන අමුද්‍රව්‍ය වලින් දිළිසෙන පිත්තල පත්කඩ හදන්න හැකියාව ඇති අය ගැන සිතන්න. මගේ පුංචි පැතලි යකඩ කෑල්ලෙ ඇති කළු රවුම් කළු නිකල් වලින් තමයි හදල තියෙන්නෙ. කුමක්ද කළු නිකල් කියන ලෝහය? කොහොමද එය මෙතෙන්ට පාවිච්චි කරගත්තෙ? මගේ පුංචි පැතලි යකඩ කෑල්ල මැද්දෙ කළු නිකල් නැත්තෙ ඇයි කියන සම්පූර්ණ කතන්දරය කියන්න තව පිටු ගණනාවක් යාවි.

මාව පාවිච්චියේ දී මිනිසා අතින් සිද්ධ වෙන වැරදි මකන්න ගන්න මකනය තමයි මගේ ඔටුන්න වගේ තියෙන්නෙ. වැරදි මකන්න උදව් වෙන්නෙ එහි තියෙන ෆැක්ටීස් යන රසද්‍රව්‍යයයි. ඉන්දුනීසියාවේ රේප්-සීඩ් තෙල් සමඟ සල්ෆර් ක්ලෝරයිඩ් දමා කරන ප්‍රතික්‍රියාවකින් ලැබෙන නිෂ්පාදනයකින් තමයි මේ රබර් වගේ කෑල්ල හදන්නෙ. මකනෙ තියෙන්නෙ රබර් කියල බහුතරය හිතාගෙන හිටියට, මෙහි තියෙන රබර්, ඒවා ඔක්කොම එකට එකතු කරල තියන්න දාන ඩිංගක් විතරයි. එතැනත් සහායට එන තව ද්‍රව්‍ය රාශියක් තියනවා. ඉතාලියෙන් එන ලුහු යමහල් පාෂාණ එක්ක මේ මකනෙට පාට ලබාදෙන කැඩ්මියම් සල්ෆයිඩ් යනාදිය අමතක කරන්නත් බැහැ.

## කවුරුත් දන්නෙ නැහැ

මේ මිහිමත ඉන්න කිසිම තනි පුද්ගලයෙක් මාව හදන්න දන්නෙ නැහැයි කියපු මගේ මූලික ප්‍රකාශයට එරෙහි වෙන්න දැන් ඉතින් කවුරු හරි ඉදිරිපත් වෙනවාද?

මාව නිර්මාණයට අත දුන්න අයට එකතු වෙන්නෙ මිලියන ගණනක මිනිස් සංඛ්‍යාවක්. ඒ අය අතර ඉන්න කෙනෙක් ඊට සහභාගි වෙච්ච අනිත් අය අතරින් දන්නෙ ඉතාමත් ඉතා ස්වල්ප දෙනෙක්ව පමණයි. බ්‍රසීලයේ කෝපි ගෙඩි කඩන අයව, අනිකුත් ආහාර නිෂ්පාදන කරන අයව, මගේ නිර්මාණයට සහභාගී වූ අය ලෙසින් සඳහන් කරනවිට මම අනවශ්‍ය ලෙසින් දුර දිග කියා කියල ඔබ අපවාද නගන්නට ඉඩ තියෙනවා. ඒත් මම ඒ ප්‍රකාශය වෙනුවෙන් පෙනී සිටිනවා. මේ මිලියන ගණනක පිරිස අතර, පැන්සල් කොම්පැණියේ සභාපතිවරයා ද ඇතුළුව, මාව හදන දැනුමෙන් ඉතාමත් ඉතා ඩිංගිත්තකට වඩා වැඩියෙන් දන්න කිසිවෙක් නැහැ. දැනුම සැලකිල්ලට ගත්තම ඇත්තෙ එක් අයෙකුට තියෙන්නෙ මොන දැනුමද කියන එක ගැන වෙනසක් විතරයි. ලංකාවේ සිටින ග්‍රැෆයිට් පතල් කනින්නා අතර සහ ඔරිගන් හි සිටින ලී කපන්නා අතර ඇත්තේ මොන මාදිලියේ වූ දැනුමක්ද යන්නයි එකම වෙනස. පතල් කනින පුද්ගලයාවත්, ලී කපන පුද්ගලයාවත් පැත්තකට බැහැර කරන්න නොහැකියි. ඒ වගේම කම්හලේ ඉන්න රසඥයා වගේම තෙල් නිධියේ ශ්‍රමිකයාද යනු පැන්සල හදන්නට අනවශ්‍ය වූවෙක් යැයි කියන්නත් බැහැ. මොකද පැරෆින් කියන්නෙ පැට්‍රෝලියම් වලින් ලැබෙන අතුරු නිෂ්පාදනයක්.

මෙන්න පුදුම සහගත පරිසිද්ධියක්: තෙල් නිධියේ ශ්‍රමිකයා, රසඥයා, ග්‍රැෆයිට් පතල්කරුවා, මැටි හාරන්නා, නැව්, කෝච්චි හා ලොරි හදන මිනිස්සු, මගේ යකඩ කෑල්ල තලන්න අඹන්න කම්හලේ මැෂින් දුවවන අය, ඒ වගේම මේ පැන්සල් කොම්පැණියේ සභාපතිවරයා ඒ ඒ අයගේ ඒකීය වූ කාර්යයේ නියැළෙන්නෙ මාව හදන්න අවශ්‍ය නිසා නොවේ. ඒ හැම එක්කෙනෙකුටම මාව දකින්න ඇති අවශ්‍යතාවය හෝඩි පංතියේ ඉන්න දරුවෙකුටත් වඩා අඩුවෙන් තියෙන්නක් වෙන්නැති. මේ පිරිස අතර පැන්සලක් කවදාවත් දැකලා නැති අය ඉන්න පුළුවන්. පැන්සලක් පාවිච්චි කරන්න

නොදන්න අය ඉන්න පුළුවන්. එයාලගෙ අභිප්‍රාය මට බාහිරව තිබෙන්නක්. සමහර විට එය මෙන්න මෙවැනි එකක් වෙන්නැති: මේ මිලියන ගණනකින් වූ පිරිසේ හැම එක්කෙනාම දකින දෙයක් තමයි එයා තුළ ඇති ඉතාමත් ඇබිත්තන් වූ දැනුම ඔහුට අවශ්‍ය සහ උවමනා වූ භාණ්ඩ සහ සේවා වලට හුවමාරු කරගන්නට හැකියාව ඇතැයි දැකීම. මම ඔහුට අවශ්‍ය සහ උවමනා වූ භාණ්ඩ සහ සේවා අතරින් එකක් වෙන්නත් හෝ නොවෙන්නත් පුළුවන්.

## මාස්ටර් මොළයක් නැතිකම

ඊටත් වඩා පුදුම සහගත වූ තවත් පරිසිද්ධියක් තියෙනව: ඒක තමයි මාව නිර්මාණයට මුල් වූ මාස්ටර් මොළයක් නැතිකම. මේ ගණනය කළ නොහැකි තරම් වූ ක්‍රියා සමුදායක් මෙහෙයවන කිසිම කෙනෙක් නොසිටීම. එහෙම කෙනෙක්ව හොයාගන්න බැරිකම. ඒ වෙනුවට අපිට දකින්න ලැබෙන්නෙ **අදිසි හස්තයක්** වැඩකරන හැටි. මේක තමයි මම කලින් කියපු අබිරහස.

'ගහක් හදන්න පුළුවන් දෙවියන්ට පමණයි,' යැයි කියමනක් ඇත. ඇයි අපි ඊට එකඟ වෙන්නෙ? අපිට ගහක් හදන්න බැහැ කියල දන්න නිසා නේද? අනික, අපිට පුළුවන්ද ගහක් විස්තර කරන්නටවත්? අපිට පුළුවන්ද මතුපිටින් පෙනෙන කොටස හැරෙන්නට ඒ ගැන කියන්නට? අපිට පුළුවන් කියන්න යම් අණුක පිළිවෙලක් නිසා ගහක් ඒ විදියට හැදිලා තියෙනවා කියල. ඒත් මිනිසුන් අතර කවුද ඉන්නෙ ගහක ජීවිත කාලයක් තුළ සිද්ධ වෙන අණුක වෙනස් කරන්නට අණදෙන්න පුළුවන් අයෙක්, ඒ නිතර වෙනස්වෙන විදිය ගැන වාර්තා කරන්න හැකියාව තියෙන පුද්ගලයෙක්? එවැනි හැකියාවක් ගැන සිතන්න නොහැකියි!

මම, පැන්සල සංකීර්ණ වූ ක්‍රියාවලියක හාස්කමකි. ගසකින්, සින්ක්, කොපර්, ග්‍රැෆයිට් යනාදීන් වෙතින් හැදුනක්. ඒත් මේ ස්වභාව ධර්මයේ ඇති හාස්කම්වලට තවත් අතිශය වැදගත් වූ හාස්කමක් එකතුවෙලා තියෙනව. ඒක තමයි නිර්මාණශීලී මිනිස් උත්සාහයන් වල සහාය. මිනිස් අවශ්‍යතා සහ මිනිස් ආශාවන් (මාස්ටර් මොළයක නියාමන නැතිව) සපුරාගන්නට මිලියන ගණනක මිනිසුන් පිරිසක් විසින් ස්වභාවයෙන් හා ඕපපාතික ලෙසින් ප්‍රතිචාරයක් දක්වන නිසා සිද්ධ වූ හාස්කමක්. ඉතින් ගහක් හදන්නට පුළුවන් දෙවියන්ට පමණක් නිසා, මම තරයේ කියා සිටිනවා මාව හදන්නත් පුළුවන්කමක් ඇත්තේද දෙවියන්ට පමණයි කියා. අණුක එකතුවකින් ගහක් හදන්න මිනිසාට බැහැ වගේම මාව හදන්නත් මේ මිලියන ගණනකගේ දැනුම එකතු කරන්නට එක මිනිසෙක් සමත් නැහැ.

ඉතින් කතාව පටන් ගනිද්දී මම කියූ "ඔබට පුළුවන් නම් මම සංකේතවත් කරන හාස්කම ගැන යම් දැනීමක් ඇති කරගන්නට, එවිට ඔබට හැකිවේවි මිනිසා ඉතා දොම්නසින් අහිමි කරගනිමින් සිටින නිදහස බේරාගන්න," යනුවෙන් මම අදහස් කළේ ඉහත විස්තරයයි. මිනිස් උවමනා සහ ඉල්ලුම සපුරන්නට මේ දැනුම් සම්භාරයන් සියල්ලම ස්වභාවයෙන්ම, ඔව්, ඉබේම, මිනිසා අතින් නිර්මාණශීලී ලෙසත්, මිනිසාට ඵලදායක ලෙසටත් හැඩගැසෙනවා. එහෙම වෙන්නේ ආණ්ඩුවක් හෝ වෙනත් බලහත්කාරකම් කරන මාස්ටර් මොළයක් ඇඟිලි ගහන්නේ නැතිවිටයි. එවිට තමයි අයෙකුට පරම වශයෙන්ම නැතිවම බැරි වූ නිදහසේ අංගයක් භුක්ති විඳින්නත් ඉඩක් ලැබෙන්නෙ. නිදහසේ අංගයක් තමයි නිදහස් මිනිසුන් ගැන ඇති විශ්වාසය. මේ විශ්වාසය නැතිව නිදහස ඇතිවෙන්නෙ නැහැ.

ආණ්ඩුවකට යම් නිර්මාණශීලී ක්‍රියාවක් සඳහා මොනොපොලියක් තිබෙද්දී -අපි කියමු තැපැල් බෙදාහරින්නට කියා- එවිට බහුතර ජනතාව හිතන්නේ නිදහස් මිනිසුන් ලෙසින් කටයුතු කරද්දී තැපැල් බෙදාහරින්නට බැහැයි කියල. මෙන්න මේකයි හේතුව: හැම එක්කෙනෙක්ම පිළිගන්නවා තැපැල් බෙදාහැරීමේ සියලු අංගෝපාංගයන් ඉටුකරන්න තමන් දන්නෙ නැහැයි කියන කාරණය. ඒ වගේම එයාට පේනවා වෙන කිසිම පුද්ගලයෙකුටත් එය කරන්න දැනුමක් නැතැයි කියන කාරණය. අයෙක් වටහා ගන්නා එම සිතුවිලි නිවැරදියි. රටක තැපැල් බෙදාහරින හැටි ඒකීය පුද්ගලයෙක් දන්නෙ නැතිවා වගේම තමයි පැන්සලක් හදන හැටිත් ඒකීය පුද්ගලයෙක් දන්නෙ නැතිකම. ඉතින් නිදහස් මිනිසුන් ගැන විශ්වාසයක් නැත්නම්, මිලියන ගණනක පිරිසක් තුල පවතින ඇබිත්තන්

දැනුම ස්වභාවයෙන්ම ආශ්චර්යමත් ලෙසකින් හැඩගැසිලා එකිනෙකා හා සහයෝගයෙන් මේ අවශ්‍යතාවය සපුරාගන්න එකතුවෙන බව දකින්න බැරි නම්, එවිට ඒ අයට පුළුවන් වැරදි දැක්මකින් වැරදි නිගමනයක් කරා යන්න පමණයි. තැපැල් බෙදන්න පුළුවන් ආණ්ඩුවේ මාස්ටර් මොළයකින් සැලසුම් කළහොත් පමණයි කියල වැරදියට හිතනවා.

**ඇති පමණින් සාක්ෂි**

ඉතින් මිනිසුන් නිදහස් ලෙසින් කරන කටයුතු වලින් නිපැදවෙන්නේ මම, පැන්සල යැයි පමණක් කියා සිතන්නේ නම්, ඒ අඩු විශ්වාසයෙන් යුතු වූ අයගේ පැත්තේ වාසියට ඒක ගන්න පුළුවන්. ඒත් අපිට ඇති පමණින් සාක්ෂි තියෙනවා. ඒ සියල්ල අපි ගැනයි. හැමෝගෙම අතේ තියෙන සාක්ෂි. මෝටර් රථයක් නිපැදවීම හෝ කැල්කියුලේටරයක් නිපැදවීම හෝ ධාන්‍ය මිශ්‍ර කරන යන්ත්‍රයක් හෝ මෝලක ඇති යන්ත්‍රයක් හෝ තවත් දස දහස් ගණනක වෙනත් දේවල් සමඟ සසඳා බලද්දී, තැපැල් බෙදීම ඉතා සරල වූවක්. යමක් බෙදාහැරීම කොතරම් සරල ද?

ඉතින් ඒ බෙදාහැරීම සම්බන්ධයෙන් නිර්මාණශීලී උත්සාහයන් ගන්නට නිදහස ලැබුණු මිනිසා එක තත්පරයකට වඩා අඩු කාලයකින් මිනිස් කටහඬ ලෝකයේ ඕනෑම තැනකට බෙදාහරින්නට සමත්වී තිබෙනවා. පැය හතරකට වඩා අඩු කාලයක දී සියැටල් සිට බෝල්ටිමෝර් දක්වා මඟීන් 150 දෙනෙකු ගෙනියන්නට සමත්වී තිබෙනවා. සහනාධාර නැතිව විශ්වාස කළ නොහැකි තරම් අඩු මිලකට ටෙක්සාස් සිට නිව් යෝර්ක් නගරයේ උදුනකට හෝ ලිපකට හෝ ගෑස් බෙදාහරින්නට සමත්වී තිබෙනවා. ආණ්ඩුව මඟින් පාර ඉස්සරහ තියෙන ගෙදරට යවන අවුන්සයේ ලිපියට ගෙවන්න වෙලා තියෙන වියදමට වඩා අඩු මුදලකින් ලෝකෙ එහා පැත්තෙ තියන පර්සියන් බොක්කේ සිට ඇමෙරිකාවේ ඊසාන දිග වෙරළබඩට තෙල් රාත්තල් හතරක් ගේන්න සමත්වෙලා තියනවා!

මට කියාදෙන්න ඇති පාඩම මෙයයි: **සියළු නිර්මාණශීලී උත්සාහයන්ට ඉඩක් ලබාදෙන්න.** මේ පාඩම එක්ක එකමුතුබවකින් ක්‍රියාකරන ලෙසින් පමණක් සමාජය සංවිධානය කරන්න. එයට ඇති බාධක හැකි තරමින් ඉවත් කරගන්න රටේ නීති පද්ධතිය ලවා සහාය ලබාගන්න. මේ නිර්මාණශීලී දැනුම නිදහසේ ගලායන්න අවස්ථාවක් පාදන්න. අදිසි හස්තයට නිදහස් මිනිසුන් සහ ගැහැණුන් යහපත් ප්‍රතිචාර දක්වාවි කියල විශ්වාසයක් ඇති කරගන්න. ඒ විශ්වාසය තහවුරු වේවි. සරල උපකරණයක් වූ මම, පැන්සල යනු මගේ උප්පත්තියේ හාස්කමයි, එනම් හිරු, වැස්ස, සීඩ ගහ, මේ සාර භූමිය යනාදීන් ලෙසින්ම වූ, මේ ඒකීය මිනිස් නිර්මාණශීලීත්වය නම් වූ ප්‍රායෝගික හාස්කමේ සාක්ෂියයි. මම ඒ වෙනුවෙන් පෙනී සිටිමි.

**ලෙනාර්ඩ් ඊ. රීඩ්**

# පසුවදන

මම, පැන්සල නමින් ලෙනාර්ඩ් ඊ. රීඩ් ලියූ රසවත් කතාව සම්භාව්‍ය කෘතියක් බවට පත්ව ඇත. එය ඊට සුදුසු වූවකි. මෙතරම් ලුහුඬු බවකින්, ඒත්තු යන ලෙසකින්, සාර්ථක අන්දමකින් අදහස් දෙකක් පහදා දුන් තවත් සාහිත්‍ය උත්සාහයක් ගැන මා නොදන්නෙමි. මෙහි දී අවබෝධයක් ලබාදෙන අදහස් දෙකින් එකක් නම් ඇඩම් ස්මිත්ගේ අදිසි හස්තයයි. බලහත්කාරකමක් නොකර මිනිසා වෙතින් නිර්මාණයකට සහයෝගය ලබාගත හැකියාවට ඉඩක් ඇතැයි එයින් පෙන්වා දෙයි. අනෙක නම් ෆ්‍රීඩ්රික් හයෙක්ගේ අදහසයි. එනම් තැන් තැන්වල පිහිටා ඇති දැනුමේ වැදගත්කම සහ "කවුරුත් මෙසේ කරන්නට යැයි කියන්නට අවශ්‍යතාවයක් නැතිවම ඒකීය පුද්ගලයන් කරනුයේ ප්‍රිය උපදවන දැයයි," යන සන්නිවේදනය මඟින් මිල තීරණය වන පද්ධතියක කාර්යය භාරයයි.

ලෙනාර්ඩ්ගේ කතාව අපේ රූපවාහිනී වැඩසටහනකට අපි යොදා ගත්තෙමු. "තෝරාගැනීමට ඇති නිදහස" යන සිරස්තලයෙන් වූ ඒ හා ඒ නමින්ම බෙදාහරින ලද පොතේ, අපි "වෙළඳපොළේ බලය" (පොතේ පළමු පරිච්ඡේදයේ නම සහ වැඩසටහනේ මුල් කොටසේ නම) පැහැදිලි කිරීම සඳහා භාවිතා කළෙමු. කතන්දරයේ සාරාංශයක් ඉදිරිපත් කරමින් අපි මෙසේද කීවෙමු:

"පැන්සලක් නිෂ්පාදනයට දායක වූ දහස් ගණනක පිරිස අතර කිසිවෙක් තම කාර්ය භාරය ඉටු කළේ පැන්සලක් උවමනා වූ නිසා නොවේ. ඔවුන් අතර සමහරු කිසිදා පැන්සලක් දැක්කේ නැත. එය කුමකට අවශ්‍යදැයි නොදත්හ. හැමෝම තම වැඩ කොටස දිහා බැලුවේ තම තමන්ට අවශ්‍ය භාණ්ඩ හා සේවා ගන්නට හැකි ක්‍රමයක් හැටියට පමණි. භාණ්ඩ හා සේවා අපි නිෂ්පාදනය කළේ අපිට අවශ්‍ය පැන්සල ගන්නට හැකියාව ලබාගන්නටය. කඩයකට ගොස් පැන්සලක් මිල දී ගන්නා හැම අවස්ථාවක දී ම, අපෙන් ඇබිත්තක් දී දහස් ගණනක පිරිසක් පැන්සලක් හදන්න දුන් සහයෝගයෙන් ඉතා ඇබිත්තක් අප වෙත හුවමාරු කර ගනිමු.

ඊටත් වඩා පුදුමය ජනිත කරවන්නක් නම් පැන්සල ලොවට බිහිවීමයි. මධ්‍යම සැලසුම් හදන කාර්යාලයක වාඩිවී මෙයට සහභාගී වූ දහස් ගණනක පිරිසකට කිසිවෙක් අණ නිකුත් කළේ නැත. නොදුන් අණ ක්‍රියාත්මක කරන්නට මිලිටරි පොලීසියක් වෙහෙසුනේ නැත. මේ ජනතාව නොයෙක් රට රටවල වාසය කරති. විවිධ භාෂා කතා කරති. විවිධ ආගම් අදහති. සමහර විට ඔවුන් අතර එකිනෙකාට ද්වේශ කරන අයද සිටිනවා විය හැකියි. එහෙත් පැන්සල නිෂ්පාදනයට එරෙහි වෙන බාධාවක් වශයෙන් ඒ වෙනස්කම් එකක්වත් හේතු වූයේ නැත. කෙසේද එහෙම සිද්ධ වූයේ? එයට උත්තරය වසර දෙසියයකට පෙර ඇඩම් ස්මිත් ලබා දී තිබුණි."

"මම, පැන්සල" ලෙනාර්ඩ් රීඩ් නිර්මාණයකට කදිම නිදසුනකි. එය සරලය. එහෙත් සියුම් ද වෙයි. පරිකල්පනයෙන් යුතුය. ලෙනාර්ඩ් ලියූ හෝ කළ දේවල් සියල්ලේම දකින්නට හැකි, ඔහු නිදහස වෙනුවෙන් දැක්වූ දැඩි ආදරය මෙහිදී ද දකින්නට හැකියි. ඔහුගේ අනෙකුත් කටයුතුවල දී ද, ඔහු කිසිවිටෙක අනිකුත් අයට ජීවත්වෙන්නේ කෙසේදැයි කියා හෝ කළ යුත්තේ කුමක්දැයි කියන්නට නොයයි. ඔහු හැම විටම උත්සාහ ගන්නේ තමන් ජීවත්වෙන සමාජ පද්ධතිය ගැන අවබෝධයක් ලබන්නට යැයි ඔවුනට කීමටයි. ඒ සඳහා ඔහු කරන්නේ ඒකීය පුද්ගලයන්ට තමන් ගැන අවබෝධයක් ලබාගන්න අත දෙන්නට උත්සාහයක් පමණකි.

එය ඔහුගේ මූලික ඇදහිල්ල විය. මහජන සේවය වෙනුවෙන් කැප කළ දීර්ඝ කාලය තුළ ඔහු එය වෙනුවෙන් පෙනී සිටියේය. ඔහු මහජන සේවය කළා යැයි කියද්දී මෙහිදී ඔහු නිරත වූයේ රජයේ සේවයේ යැයි අදහස් නොවේ. ඔහු තම සිද්ධාන්ත කිසිවිටෙක පාවා දුන්නේ නැත. ඒ නිසා ඔහු මුල් කාලයේ දී ජීවතුන් අතර සිටින්නට භාග්‍යය ලද්දේය. අනතුරුව මිනිසාට තම නිදහස සාක්ෂාත් කරගන්නට නම් පෞද්ගලික දේපල, නිදහස් තරඟය සහ දැඩි සේ සීමිත වූ ආණ්ඩුවක් අවශ්‍ය යැයි කියන මූලික අදහස පතුරුවා හරින්නට ඔහු මහත් සේ කැප වූයේය.

**1976 නොබෙල් ත්‍යාගලාභී මිල්ටන් ෆ්‍රීඩ්මන්**